# කණ්ඩලම කළුදිය පොකුණ පුරාවිද්‍යා පරිශ්‍රයට උරුම කළමණාකරණ සැලැස්මක්

ඇතාබැදිවැවේ නාලක හිමි

පුරාවිද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

nalakahimi.19910401@gmail.com

**ප්‍රමුඛ පද:** සංස්කෘතික උරුම, ස්වාභාවික උරුම, කළුදිය පොකුණ, සංරක්ෂණය, කළමණාකරණ

## හැඳින්වීම

පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ ක්‍රියාකාරි ස්වභාවය නම් පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත උරුම ස්ථානයක් නිසියාකාරව සැලසුම් කිරීම, සංරක්ෂණය කිරීම හා අරක්ෂාකරමින් අනාගත පරපුර සඳහා ඉදිරිපත් කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම වෙයි (ගුණවර්ධන, 2005:15). ඒ අනුව ශ්‍රී ලංකාවේ ලෝකඋරුම පුරාවිද්‍ය ස්ථාන වන දඹුල්ල හා සීගිරිය ස්ථානයන්ට මධ්‍යයේ පිහිටි කණ්ඩලම කළුදිය පොකුණ පුරාවිද්‍යා ස්ථානය සංස්කෘතික හා ස්වභාවික උරුමයන්ගෙන් අනූන සුවිශේෂී ස්ථානයක් වන දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය ද ලබා ගත හැකි ස්ථානයකි. ඓතිහාසික අවධි කිහිපයක් තුළ ගොඩනැගුනු මෙම ස්ථානය පබ්බතාරාම විහාර සංකීර්ණයක් බව වාස්තුවිද්‍යාත්මක අංග තුළින් හඳුනාගත හැකිය. මෙහි දක්නට ඇති ස්ථූපය, බෝධිඝරය, උපෝසථාඝරය වැනි වාස්තුවිද්‍යාත්මක අංගයන් බෞද්ධ උරුමයේ ලක්ෂණ විදහාපායි. බෞද්ධ උරුමයක් වුව ද මෙය සමස්ත ජනතාවට අයිති දායාදයකි. කෙසේ වෙතත් වර්තමානය වන විට මෙම ස්ථානය හුදකලා ස්ථානයකි. පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමට ඇති ආයතනවලින් පවා මෙම ස්ථානය පිළිබඳව අවධානය ගිලිහී ගොස් තිබේ. එනිසාවෙන්ම මෙම ස්ථානයේ පුරාවිද්‍යා උරුමය ශීඝ්‍ර පරිහානියකට ලක්ව ඇත. මෙහි උරුමය මනාව හඳුනාගෙන උරුම කළමනිකරණයේ දී වගකිවයුතු ආයතන මඟින් ආරක්ෂක වැඩ පිළිවෙලක්, භෞතික සම්පත් වර්ධනය කිරීම, උරුම සංරක්ෂණ හා කළමණාකරණ සැලසුම් යොදා සුරක්ෂිත කොට මතු පරපුරට දායාද කිරීම ය. කළුදිය පොකුණ සඳහා සීගිරිය හා දඹුල්ල ලෝක උරුම ස්ථාන ඒකාබද්ධ කොට උරුම කළමණාකරණ සැලැස්මක ආදේශ කළ හැක්කේ කේසේ ද යන්න විමසාබැලීමත්, උරුමය නිවැරදිව හඳුනාගෙන උරුම සංරක්ෂණය හා කළමණාකරණය කිරීමට කිනම් මැදිහත් වීමක් සිදුකළ යුතුද, උරුමය සමාජගත කර සෙසු පුරාවිද්‍යා ස්ථාන හා ඒකාබද්ධ කොට සංචාරක ආකර්ෂණය ඇති ස්ථානයක් බවට පත්කිරීම සඳහා සැලසුමක් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කළෙමි. මෙම ස්ථානය හා සම්බන්ධ දැණුමැති පුද්ගලයන් සමග සම්මුක සාකච්ඡා සිදු කරණ ලදි. මෙම ස්ථානයේ භෞතික පිහිටීම හා කේවල අධ්‍යයනයන්ද පුස්තකාල ගවේෂණයන්ද සිදු කරන ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

කණ්ඩලම කළුදියපොකුණ ශ්‍රී ලංකාවේ මධ්‍යම පලාතේ වගපනහපල්ලේසිය පත්තුවේ (දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ) කුඹුක්කඳන්වල සිට හැතැක්ම එකහමරක් පමණ ගිණිකොණින් පිහිටි එරවලගල නමින් ප්‍රසිද්ධ කඳුපන්තිය පාමුල පිහිටා තිබේ. සීගිරිය-දඹුල්ල ලෝක උරුම ස්ථානයන් මධ්‍යයේ පිහිටා ඇති මෙම ස්ථානයට යාබදව මැණික්දෙන පබ්බතාරාමය හා ඉබ්බන්කටුව මෙගලිතික සුසාන පිහිටා ඇත.

මෙම ස්ථානයෙහි ඉතිහාසය සද්ධාතිස්ස රාජ්‍ය කාලය දක්වා දිවයයි. ඒ අනුව ක්‍රිස්තු පූර්ව යුගයේ සිට පොළොන්නරු යුගයේ අවසාන කාලය දක්වා විටින් විට රජවරු විවිධ ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු සිදු කර ඇත. මෙම ස්ථානයෙන් සොයාගෙන ඇති ශිලාලේඛන තුළින් එය වැඩිදුරටත් තහවුරු කරගත හැකිය. මෙම ස්ථානයේ සංරක්ෂණ කටයුතු සිව්වැනි සේන රජුගේ කාලයේ සිදුකර ඇති අතර පොළොන්නරුව රාජධානියේ අවසානයත් සමඟ මෙම ස්ථානය පිළිබඳව අවධානය නොලැබීමෙන් මෙම ආරාම සංකීර්ණය අභාවයට ගොස් ඇත. අතීතයේ දී මෙම ස්ථානය දක්ඛිනගිරිවිහාරය ලෙස හඳුන්වා ඇති අතර අනුරාධපුරයේ දක්ඛිණගිරි විහාරයත් මෙයත් විහාර දෙකකි.

කණ්ඩලම කළුදියපොකුණ ස්ථානයේ උරුමය පිළිබඳව විමසීමෙ දී සංස්කෘතික හා ස්වභාවික උරුමයෙන් පෝෂිත ස්ථානයක් ලෙස පෙන්වාදිය හැකිය. මෙහි සංස්කෘතික උරුමය ලෙස ස්ථූපය, බෝධිඝරය, උපොසථාඝරය ආදී වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් හා ශිලාලේඛණ, කටාරම් සහිත ලෙන් පෙන්වාදිය හැකිය. මෙම ස්ථානයේ ශිලාලේඛණ 12ක් පමණ දක්නට ඇති අතර එක් ශිලාලේඛණයක් පුවරු ලිපියකි. පුවරුලිපිය හැර අනෙක් ලෙන්ලිපි සියල්ල බ්‍රාහ්මී අක්ෂරවලින් යුක්තය. පුවරු ලිපිය සිව්වැනි සේන රජුගේ කාලයට අයත් වේ. සමස්ත ශිලාලේඛණවලින් ආරාම පූජාවන් පිළිබඳව දැක්වෙන අතර පුවරු ලිපියෙහි තෙවැනි උදය රජුගේ බිරිද වන විදූරා දේවියගේ නාමය සදහන් වීම ද විශේෂත්වයකි.

කළුදියපොකුණ ආරාම සංකීර්ණය අයත් මෙම භූමියේ සංස්කෘතික උරුමයට අමතරව මනස්කාන්ත පරිසරයකට පද්ධතියකට හිමිකම් කියන ස්ථානයකි. මෙවැනි අගනා සංස්කෘතික හා ස්වාභාවික උරුමයෙන් යුත් කළුදිය පොකුණ පුරාවිද්‍යා ස්ථානයේ සංස්කෘතික උරුමය හා ස්වාභාවික උරුමය දිනෙන් දින විවිධ මානව ක්‍රියාකාරකම්, නිසි උරුම සංරක්ෂණ සැලසුම්, උරුම කළමණාකරණ සැලසුම් ආදේශ නොවීමෙන් සීග්‍ර පරිහානියට පත් වෙමින් පවතී.

වර්තමානයේ මෙරට පුරාවිද්‍යා ස්ථාන සඳහා උරුම සංරක්ෂණ හා කළමණාකරණ සැලසුම් තිබුණ ද තවත් බොහෝ උරුම ස්ථානවලට එවැනි සැලසුම් නොමැති වීමෙන් ඒවා අභාවිත තත්ත්වයට පත් වී තිබේ. කළුදියපොකුණ ද එවැනි උරුම කළමණාකරණ සැලසුමක් නොමැති සංස්කෘතික හා ස්වාභාවික උරුමයන්ගෙන් පෝෂිත ස්ථානයකි. 1977 වර්ෂයේ දී සිදු කරණ ලද පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යන්ගෙන් පසු මේ වනතෙක් මෙම ස්ථානයේ කිසිදු සංරක්ෂණ කටයුත්තක් සිදුකර නොමැත. එනිසා මෙම ස්ථානය වර්තමානයේ දී හුදකලා වී තිබේ. හුදකලා බව හා පරිහානියට පත්වීමේ හේතුව මෙම ස්ථානය සඳහා නිසි උරුම සංරක්ෂණ හා කළමණාකරණ සැලසුමක් නොමති වීමයි. මෙම ස්ථානයේ සිදු කළ නිරීක්ෂණයේ දී පෙනීගියේ කළුදිය පොකුනෙහි උරුමය ශීග්‍රයෙන් පරිහානියට පත්වන බවයි. ඒ සඳහා බලපාන උරුම සංරක්ෂණ හා

කළමණාකරණ ගැටළු රැසක් හඳුනාගත හැකිවිය.

- නිසි උරුම සංරක්‍ෂණ කළමණාකරණ සැලසුමක් නොමැති වීම
- මිනිසුන්ගේ අනවසර බලපෑම්
- පුරාවිද්‍යා විෂයානුබද්ධ නිලධාරීන් නොමැති වීම
- නිසි ආරක්‍ෂක වැඩ පිළිවෙලක් නොමැති වීම
- මානව සම්පත් හිඟය
- සෙසු පුරාවිද්‍යා ස්ථාන හා ඒකාබද්ධ නොවීම

මේ වනවිටත් කළුදියපොකුණට යන මර්ගය පවා දැඩි අබලන් තත්ත්වයකට පත්ව ඇත. මෙහි ඇති බෞද්ධ ආරාම සංකීර්ණයට අයත් ස්ථූපය, බෝධිඝරය, උපෝසථාඝරය, වැනි වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්හි දීර්ග කාලයක සිට නිසි සංරක්‍ෂණ ක්‍රියාවලියක් සිදු නොකර ඇතිබැවින් විශාල පරිහානියකට ලක්ව ඇත. වර්තමානය වන විටත් මෙහි තහවුරු කර නොගත් පුරාවිද්‍යාත්මක සාධක විශාල ප්‍රමාණයක් භූමිය පුරාවට දැකගත හැකිය. ඒ අතර මුරගල් කොරවක්ගල් තවමත් තහවුරු කර නොගත් ප්‍රතිමා ගෘහයක යැයි සැලකිය හැකි වාස්තුවිද්‍යාත්මක අවශේෂයන් ද වේ. මේ පිළිබඳව වගකිවයුතු ආයතන මැදිහත්වී උරුම සංරක්‍ෂණ සැලසුම් දෛනික මාසික හා වාර්ෂික වශයෙන් සිදුකළ යුතුය.

මෙහි ඇති උරුම සංරක්‍ෂණය පිළිබඳව දැනුමැති නිලධාරීන් නොමැති වීමෙන් ද පරිහානිය තවත් වැඩිවී තිබේ. මේ වනවිට සුලු සේවකයින් දෙදෙනෙකු පමණක් ආරක්‍ෂාවට හා මෙහි දෛනික කටයුතු සිදුකිරීමට සිටී. මෙම ස්ථානයේ නිසි ආරක්‍ෂක වැඩපිළිවෙලක් නොමැති අතර බොහෝ පුරාවස්තු විනාශයට මෙම තත්වය තදින්ම බලපායි. එය කෙනෙක් බලපෑම් සිදුකර ඇත්දැයි අධ්‍යයනය කරනවිට සංස්කෘතික හා ස්වභාවික උරුමයට දැඩි තර්ජන එල්ලවී තිබෙයි. මෙම තවත් හේතුවක් වන්නේ මෙම ස්ථානය ආශ්‍රිත ව ජීවත් වන ජනතාවට ද කළුදිය පොකුණ පුරාවිද්‍යා ස්ථානය පිළිබඳව අවබෝධයක් නොමැති වීමයි. නිසි ආරක්‍ෂක වැඩපිළිවෙලක් හා ජනතාව ඇනුවත් කිරීමේ සැලැස්මක් ද ක්‍රියාත්මක කළ යුතුය.

පුරාවිද්‍යාත්මක උරුම කළමණාකරණය යනු උරුම ස්ථාන සඳහා නිසි සැලසුම් ඉදිරිපත් කොට විධිමත් සැලසුමකින් ආනාගතයට දායාද කිරීමයි. කළුදියපොකුණ සඳහා උරුම කළමණාකරණ සැලස්මක් සෙසු ස්ථාන හා ඒකාබද්ධ කරමින් ඉදිරිපත් කළ යුතුය. දඹුල්ල සීගිරිය ලෝකඋරුම ස්ථාන මධ්‍යයේ පිහිටා තිබීම නිසාවෙන් එවැනි සැලැස්මක් ඉදිරිපත් කිරීම ඉතා පහසුය. ඒ අනුව දඹුල්ලට පැමිණෙන සංචාරකයා කළුදියපොකුණටත් ඉන් පසුව සීගිරියටත් යා හැකි පරිදි සංචාරක ගමන් මාර්ගයක් සකස් කළ හැකිය. එවැනි උරුම කළමණාකරණ සැලැස්මක් යටතේ දෙස් විදෙස් සංචාරකයාගේ ආකර්ශනය මෙම ස්ථානය සඳහා ලබා ගත හැකි වේ. සංචාරකයාට අවශ්‍ය යටිතල පහසුකම් ද ප්‍රමාණවත් පරිදි මෙම ප්‍රදේශයෙන් ලබා ගත හැකි වෙයි.

කළුදියපොකුණ ඓතිහාසික වශයෙන් වටිනා පබ්බතාරාම සංකීර්ණයකි. එසේම සංස්කෘතික හා ස්වාභාවික උරුමයෙන් අනූන ස්ථානයක් බැවින් උරුම සංරක්‍ෂණ හා කළමණාකරණ සැලසුමක් සෙසු ස්ථාන හා එකාබද්ධ කරමින් ඉදිරිපත් කිරීම හරහා මෙම ස්ථානයේ හුදකලා බව හා පරිහානිකර ස්වභාවය මඟහරවා සංචාරක ආකර්ශනය ඇති ස්ථානයක් බවට පත් කළ හැකිය. කළුදියපොකුණ උරුමය පිළිබඳව අධ්‍යයනය කොට එහි උරුමය සමාජගත කිරීම ආරක්‍ෂා කිරීම අපසතු වගකීමකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ගුණවර්ධන, ප්‍රියශාන්ත. (2005)*පුරාවිද්‍යා උරුම ආකෘති සංකල්පය සහ කළමණාකරණය*.ජා-ඇල: සමන්ති ප්‍රකාශකයෝ.

ප්‍රියංගිකා, ඩී.එම්.එස්.ආර්. (2008)*පුරාවිද්‍යාත්මක උරුමය හා සංවර්ධනය*.කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.